# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 682/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 21/04/2024 පැය 1225

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.04.20 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 90 | 200 | යතුරු පැදි 01<br>තඹ දඟර 03<br>යකඩ බැරල් 02<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2024.04.20 වන දින රාත්‍රී කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාලච්චේන පොලිස් වසමේ වාලච්චේන ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 810 ක් සමඟ සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා බවට සැක කරන මුදල් රුපියල් විසිහත් දහස් පන්සියයක් , ජංගම දුරකථනයක් සමඟ** අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. ගංජා මිශ්‍ර මාවා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2024.04.20 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ වැටලීමක් සිදු කර **ගංජා මිශ්‍ර මාවා කිලෝ 03 ග්‍රෑම් 450 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන යාපනය පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 40 ක් වන යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය**

2024.03.11 වන දින රාත්‍රී කාලයේ පිටිගල පොලිස් වසමේ නියාගම ප්‍රදේශයේදි සහ එදිනම අම්බලන්ගොඩ පොලිස් වසමේදී වෙඩිතබා මනුෂ්‍ය ඝාතන සිදුකිරීම සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පිටිගල පොලිස් වසමේ හොරන්ගල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **එම මනුෂ්‍ය ඝාතන සඳහා ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පිටිගල පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 43 ක් වන නෙළුගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පිටිගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**